**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාලව මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතයේ 3.9 වගන්තිය ප්‍රකාරව අයවැය හා සත්‍ය සංඛ්‍යාවන් අතර ප්‍රමාණාත්මක වෙනසක්ම් ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මීට අමතරව 2019 දෙසැම්බර් 24 දිනැති අංක 6/2155 දරන මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 99 මගින්ද මේ පිළිබඳව අවධාරණය කර තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රමිතයේ 4.6 වගන්තිය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කල බව හෙළිදරව්කර තිබුණද, 2020 ට පෙර පැවති ගොඩනැගිලි, මංමාවත්, බෝක්කු හා පාලම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද පුස්තකාල පොත් පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දින පැවති ශේෂය ප්‍රත්‍යාගණන ශේෂය ලෙස ඉදිරියට ගෙන තිබුණි . | ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 6.15 ඡේදය අනුව වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට එය අපේක්ෂා කරන රටාව පිළිඹිබු වන ක්ෂය කිරීමේ ක්‍රමයක් අස්ථිත්වය විසින් තෝරා ගත යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.5 මගින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ, | මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 8 යටතේ දක්වා ඇති රු. 6,632,814.67 ක මුදල ක්ෂය නොවන අතර වියදම්හි හරට හා බැරට සටහන් වූ ජ'නල් සටහන් කිහිපයක එකතුවකි. මෙය වැරදීමකින් ක්ෂය වැය | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | පිරියත හා උපකරණ ක්ෂය නොකරන බව සඳහන් කර තිබුණි. එසේ වුවත් මූල්‍ය ප්‍රකාශනයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් යටතේ ගණනය කළ ආකාරය පිළිබඳව තොරතුරු අනාවරණය නොකරන ලද රු.6,632,814 ක් ක්ෂයවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විස්තරය යටතේ පෙන්නුම් කර ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජ'නල් සටහන් මගින් විවිධ වියදම් රු.14,459,683 ක් හා රු. 7,826,870 ක් බැර කර ඒවා විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගලපා නොතිබුණි. | වැරදීමකින් ගැලපුම් කරන ලද මෙම වටිනාකම ක්ෂය වැය විස්තරය යටතේ දක්වා ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | ජනජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ ජෙනරේටර් සේවා කිරීම වෙනුවෙන් 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දින දක්වා රු.529,448 ක් ණයහිමි වෙන්කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී 2021 වර්ෂයට අදාළ රු.397,086 කින් ණයහිමි හා වියදම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ගැලපීමට කටයුතු කරමි. රුණික | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි වටිනාකම රු.3,814,274 ක් වුවත් ගිණුම්වල රු.3,322,679 ක් ලෙස දැක්වීම නිසා රු.491,595 කින් ගොඩනැගිලි අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්මි. | සියළුම දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | පුස්තකාල පොත් වටිනාකම වන රු.14,603,915 ක් සඳහා ක්ෂය ගණනය කළ යුතු වුවද, ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ක්ෂය වටිනාකම නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් නිම නොවූ රු.3,322,679 ක් වටිනා ගොඩනැගිලි හා රු.18,610,264 ක් වටිනා මංමාවත්, බෝක්කු හා පාලම් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම් තැබීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ඉදිකිරීම් නිමකළ පසුව පමණක් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.11,402,240 ක් වූ පොලී ආදායම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය තුලට ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කරමි. | සියළුම මුදලින් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කළ යුතුවේ. |
| (ඌ) | පිටකෝට්ටේ, පාගොඩ පාරේ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම් කොටස තාවකාලිකව ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවිය යුතු රු.2,260,000 ක් වෙන්කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් ගැලපීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | නව නගර සහා ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් උපදේශන ආයතනය වෙත 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෘත්තීය ගාස්තු රු.21,639,056 ක් හා ප්‍රමාද පොළිය රු.1,645,818 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම්වලට ගැලපීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ඒ) | බැංකු ජංගම ගිණුමට අදාලව වටිනාකම රු.20,353 ක් වූ සෘජු බැංකු බැර කිරීම් 05 ක් සහ රු. 106,414ක සෘජු බැංකු හර කිරීම් මුදල් ගිණුමට ගැලපුම්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම සහ වියදම රු.20,353 කින් සහ රු.106,414 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී බැංකුව සමහ සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ |
| (ඔ) | 2018 වර්ෂයේදී මිල දී ගනු ලැබූ වටිනාකම රු.1,577,771 ක් වූ CCTV කැමරා 32 ක් හා රූපවාහිනි යන්ත්‍ර 02 ක් ඇතුළු උපාංගවලින් සමන්විත කැමරා පද්ධතිය කට්ටල 69 කින් සමන්විත GPS තාක්ෂණ උපාංග කට්ටලය හා බේලින් යන්ත්‍රය ප්‍රාග්ධනිත කර දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් දේපළ, පිරියත හා උපකරණ අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී සොයා බලා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ |
| (ඕ) | ජනජය සිටි ව්‍යාපෘතිය වෙනුවෙන් නවලෝක කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවිය යුතු රු.1,488,509 ක් හා ප්‍රමාද පොළී රු.29,631,518 ක් හා රඳවුම් මුදල් රු.84,399,312 ක් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම නිසා එම වටිනාකමින් ණයහිමියන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී සොයා බලා ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු.671,43,237 ක වෙනසක් විය. | වෙනස්කම් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු 41,252,290,763.ක් වටිනා ගිණුම් විෂයයන් 03ක් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය හා සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණනය සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන, ලේඛන හා ඇස්තමේන්තු ඇතුළු ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371 (5) | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන්ට දෙන ලද අත්තිකාරම් රු. 3,291,097 ක් දෙසැම්බර් 31 දිනට පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනියම්, ආදේශක හා ස්ථිර සේවකයන්ගේ, ඇප මත උත්සව අත්තිකාරම් මුදල අදාල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | විශ්‍රාම ගිය සේවකයන් 34 දෙනෙකුගෙන් අයවීමට ඇති හිඟ සේවක ණය මුදල රු.1,570,614 ක් අදාල නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල්වලින් අයකර ගැනීමේ හැකියාව තිබියදී එසේ අයකර නොගෙන ඔවුන්ට "නොඉල්ලුම් සහතිකපත්" නිකුත්කර තිබූ අතර එම සහතිකපත් නිකුත් කළ නිලධාරියාගෙන් අදාල හිඟ ශේෂ අයකර ගැනීමටද කටයුතු කර නොබුණි. | විශ්‍රාමික සේවකයින්ට අදාළ වූ රු.1,570,614 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු යොදා ඇති අතර අවුරුදු දහයකට පෙර විශ්‍රාම ගොස් ඇති සේවකයන්ගේ සේවක ණය විශ්‍රාමික පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර ඒ සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් නිශ්වය කර අයකරගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.102,549,081 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන ආදායම ඉක්මවූ වියදම රු.75,615,584 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු වරිපනම් ශේෂය රු 129,457,211.ක් වූ අතර රු 50,000.ක් ඉක්ම වූ නිවාස හිස් ඉඩම් හා ව්‍යාපාර ස්ථාන 270 කින් රු.43,946,161 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී ව්‍යවස්ථාපිත නිවේදන නිකුත්කර හිඟයෙන් ප්‍රශස්ථ මට්ටමක් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කඩකුලී** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු කඩකුලී ආදායම රු.24,171,063 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හිඟ කඩකුලී ප්‍රශස්ථ මට්ටමකින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | **විනෝද බදු** | | |
| | සමාලෝචිත වර්ෂ අවසානයට අයවිය යුතු විනෝද බදු ශේෂය රු.3,169,717 ක් විය. | අයවිය යුතු විනෝද බදු ආදායම් සඳහා විෂය භාර අමාත්‍යවරයා වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලද පසු ලැබිය යුතු විනෝද බදු ආදායම් නියාදනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු විනෝද බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |
| (ඈ) | **කසළ බැහැර කිරීමේ ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු කසල බදු ශේෂය රු.4,664,226 ක් විය. | වර්තමානය වන විට ගෙවීමට අපහසු ව්‍යාපාර ස්ථාන සහන කාල සීමාවන් ලබා දීම, හිඟ ශේෂයන් වාරික වශයෙන් අයකර ගැනීම තුළින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු යොදා ඇති බව දන්වමි. | අයවිය යුතු කසළ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඉ) වරිපනම් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| රු.235,452,983 ක වරිපනම් ආදායම් හා රු.129,457,211 ක හිඟ වරිපනම් ආදායම් පරීක්ෂා කිරීමට විස්තරාත්මක උපලේඛනයේ පරිගණක මෘදුකාංග පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාල තොරතුරු කාල විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමි. | විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 හඳුනාගත් පාඩු**

**----------------**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාලව රජයේ ආධාර මගින් ‘සපිරි ගමක්’ ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අනුව ඔබේසේකරපුර ධර්මශාලා මාවත 60 වත්ත වරිපනම් අංක 48/68/1 සිට ඇති කාණුව අවශ්‍ය ස්ථානවලට ස්ලැබ් දමා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.833,161 ක ඇස්තමේන්තු සකස් කර එම කටයුතු ආරම්භ කර ඇති අතර ප්‍රදේශවාසීන්ගේ විරෝධතා නිසා ව්‍යාපෘති සැලසුම වෙනස් කරමින් රු.381,948 ක පිරිවැයක් මත එම ව්‍යාපෘතියේ වැඩ නිමකර ඇති බව නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සනාථ වන අතර එය ඵලදායී නොවන ලෙස සිදුකර ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සභාවට ආධාර ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර රු.381,948 ක් සභාවේ වියදමක් වූ අතර එය සභාවට සිදු වූ පාඩුවක් ලෙස නිරීක්ෂණය විය. | අදාල ව්‍යාපෘතිය සඳහා වියදම් වූ රු.381,948 සභාවට සිදු වූ පාඩුවක් වන අතර එය අයකර ගත නොහැකි වේ. | වගකිව යුත්තන්ගෙන් අයකර ගත යුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 පෙබරවාරි 16 දින රු.619,276,616ක කොන්ත්‍රාත් වටිනාකමට පිටකෝට්ටේ ජය රජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ 2016 පෙබරවාරි 15 දින ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා උපදේශක ගාස්තු ලෙස රු.2,638,191 ක් ඇතුළත්ව මුළු වියදම රු.255,707,477 ක් 2018 | පැරණි කොන්ත්‍රාත් ආයතනය හා උපදේශන ආයතනය මගින් ඉදිරියේදී මෙම කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. | අදාල කර්මාන්තය අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර සිදු වූ පාඩු වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය දක්වා වැයකර තිබූ අතර ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ඉරි තැලීමේ දෝෂයක් මත සභාව විසින් 2017 මැයි 17 දින ව්‍යාපෘතියේ වැඩ නතර කර ඇති අතර 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත්කරු වැඩබිම අත්හැර දමා තිබුණි. | | |
| (ආ) | ඇස්තමේන්තු වටිනාකම රු.69,704,581 ක් වූ නිවාස ඒකක 28 කින් සමන්විත මොරගස්මුල්ල සිව් මහල් නිවාස සංකීර්ණය මාස 06 ක කාල සීමාවකදී වැඩ අවසන් කර භාර දීම සඳහා 2016 ජුනි 01 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.62,986,117 ක් හා අමතර වැඩ සඳහා රු.7,538,424 ක් ඇතුළුව රු.70,524,541ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු වැඩ අවසන් නොකර කර්මාන්තය අත්හැර දමා තිබුණි. තවද 2019 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැහැරව සභාවේ සෘජු ශ්‍රමය යොදා ගනිමින් නිවාස ඒකක 18 ක් සඳහා රු.3,630,781 ක අමුද්‍රව්‍ය පිරිවැයක් හා රු.155,726 ක ආහාර, ජලය, විදුලිය සඳහා වැයකර තිබුණද වැඩ අවසන් නොකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි | මේ වනවිට අදාල ව්‍යාපෘති කටයුතු ආරම්භ කරමින් පවතී. | කර්මාන්තයේ වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට පියවර ගත යුතුවේ. |